## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය : එල්. සී. 7581.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස්කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර—

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බටගිර ගිරුවාපත්තුවේ තලහ ගම්වාඩුව නම් ගම අවසාන ගම සිතියම් නො. 236, අතිරේකය 3

**ලොට් නො. 406**

නම: පාලුගස් මන්ඩිය; විස්තර: හේන හා වත්ත අවුරුදු 20 මස් මුරුංගා ගස් 4, අවුරුදු 2—4 කොස්ගස්, අවුරුදු 30 කජුගස් එකයි, අවුරුදු 10 නාරංගස් 1, අවුරුදු 10 දෙහිගස් 1 හා බඳාමෙන් බඳිනලද වැසිකිළිය; වෙනත් විස්තර: ලොට් 4රෙන් කොටසක්. (ටී පී 69899) අධ්‍යාපන දෙපාතීමේන්තුවෙන් සාදනලද වැසිකිළිය; අයිතිවාසිකම් කියන්නෝ වලස්මුල්ලේ දෙන් එඩ්වින් අබේධීර ජයවික්‍රම, විලියම් අබේධීර ජයවික්‍රම; ඇලිස් ද සිල්වා මහත්මිය (ඇලිස් අබේධීර ජයවික්‍රම, විවාහයට පෙර), ඇනී ද අල්විස් මහත්මිය (ඇනී අබේධීර ජයවික්‍රම විවාහයට පෙර), හුංගම කිවුල ඇක්ලින් අබේධීර ජයවික්‍රම; වැල්ලවත්ත මායා ඇවනිව් හි ඩේවිඩ් අබේධීර ජයවික්‍රම; මොරටුව උයන කාල්ටන් ක්ලබ් පාරේ ඩේසි ගුණවතී මනුකුලරත්න මහත්මී (ඩේසි අබේධීර ජයවික්‍රම විවාහයට පෙර):

බිම් ප්‍රමාණය: අ. 1, රූ. 0, ප. 03.8.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959 මැයි 12 වෙනි දින උදය 10 වේලාවට වලස්මුල්ලේ නානායමේදී මා සම්මුඛ විය යුතුයි.

තවද 1959 මැයි 4 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවාභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලු හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එච්. ආර්. අමීන්,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.
23. 3. 59
හම්බන්තොට කච්චේරියේ දීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි**

සඳහන් අංකය: 3/61/26/ජේ 57/58 ඇල්. 183.

මහාජන කායඝියක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

1958වේ අගෝස්තු මස 8 වෙනි දින නො. 11,471 දරණ ලංකාණ්ඩුවේ ගැසැට් පත්‍රයේ 1958වේ ජූලි මස 24 වැනි දින නො. ජේ57/58/ඇල් 183 දරණ ඉඩමු හා ඉඩම් සංවර්ධන පිළිබඳ ගරු ඇමැතිතුමාගේ ප්‍රකාශය පරිදි—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ වැඋඩ විල්ලි හත්පත්තුවේ, බෝයගනේ පලාතේ කඳුරුකුඹුර නමැති ගමේ පිහිටි අංක 1,573 දරණ මූලික සැලැස්මේ මැන වඩා විස්තර සඳහන් වෙන පර්චස් 04.7 ක් බිම් කැබැල්ල:—

කැබැල්ලේ අංකය: 1.

ඉඩමේ නම: දිද්දෙනියේ වත්ත.

විස්තර: වගාවක් නැති පොල් ඉඩම.

ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 04.7.

අයිතිවාසිකම් කියන්නා: පී. ද ඇස්. විජයරත්න මහතා, නො. 12, පේයාර් පීල්ඩ් ගාර්ඩන්, බොරැල්ල.

අත්කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලු දෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1959ක්වූ මැයි මස 26 දින පෙරවරු 10ට කුරුණෑගල කච්චේරියේ දී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේ දී ඉල්ලන වන්දි මුදලේ විස්තර ද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තර ද 1959ක්වූ මැයි මස 19 වැනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

කේ. වී. ඇස්. කතිර්ගාමනාතන්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

කුරුණෑගල කච්චේරිය,
1959ක්වූ මාර්තු මස 23 දය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

සඳහන් අංකය: 3/63/50—ජේ.56 ඊ.73.

මහාජන කායඝියක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුව අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපණතෙන් සංශොධනය කරන ලද පරිදි 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

අත්කර ගැනීමට අදහස් කරන ඉඩමේ විස්තර:—

1957 නොවැම්බර 22 වෙනි දින නො. 11,201 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1957 මැයි මස 23 වෙනි දින අංක ජේ 56 ඊ 73 දරණ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමාගේ අණ පරිදි—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ තිරගම් දහයේ නැගෙනහිර කෝරළේ තලම්පිටිය මහගම නාමැති ගමේ පිහිටි මැන විස්තරකර ඇති නො. ඒ 1568 දරණ මූලික සිතියමේ හැඳින්වන පහත සඳහන් බිම් කැබැල්ල:—

**කැබැල්ල නො. 1.**

ඉඩමේ නම: පහල ගණ-අරඹේ ගල්-ඇඳ පිල්ලැව; විස්තරය: අවුරුදු 15 පමණ වයසැති පොල් ගස් 4ද, අවුරුදු 3 පමණ වයසැති පොල්පැල 15ද, අවුරුදු 15 පමණ වයසැති කජු ගස් 2ද, අවුරුදු 50 කොස් ගසක්ද, අවුරුදු 10 අඹ ගසක් සහ මැටි බිත්ති සහිත පොල් අතු සෙවිලි කරන ලද අත්හැර දමන ලද පැල්පතක් සහ ගල් ඇඳක් සහිත වැවුණු හේන සහ පොල් වත්ත; අයිතිකරුගේ නම: එඩ්වින් රුකුණායක සහ එස්තා රුකුණායක, පහල ගෙදර, තලම්පිටිය, මහගම, කොහිලගෙදර; ප්‍රමාණය: අ. 0, රූ. 3, ප. 07.4.

අත්කර ගැනීමට අදහස් කරන ඉහතකී ඉඩමට සම්බන්ධතාවන් ඇති සියලුදෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපියකින් බලය ලත් නියෝජිතයන් 1959ක්වූ මැයි මස 14 දින පූ. භා. 10ට කුරුණෑගල කච්චේරියේදී මා ඉදිරියේ පෙනී සිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1959ක්වූ මැයි මස 7 දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතුයයි ද නියම කරමි.

කේ. වී. ඇස්. කතිර්ගාමනාතන්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත.

කුරුණෑගල කච්චේරිය,
1959ක්වූ මාර්තු මස 17 දය.

---

## 1954රේ අංක 39 දරණ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950හේ අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

අංකය: 3/63/50/57

ජේ. 57. ඊ 322

මහජන කායඝියක් සඳහා අවශ්‍යව තිබෙන පහත සඳහන් ඉඩම ආණ්ඩුවට අත්කර ගැනීමට අදහස් කරන බව 1954රේ අංක 39 දරණ (සංශොධිත) ආඥපනතින් සංශොධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දන්වා සිටිමි.

1958 ජූලි මස 11 වැනි දින නො. 11,423 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 1958 මැයි මස 30 වැනි දින නො. ජේ 57 ඊ 322 දරන ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමතිතුමාගේ ප්‍රකාශය පරිදි—

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, මැද්දේ කැටිය කෝරළේ පෙතුවැව නමැති ගමෙහි පිහිටි නො. 2,606 දරණ අවසාන ගම් සිතියමේ නො. 1 වෙනි ඒකාබද්ධ අතිරේකයේ මැන වඩා විස්තරව හැඳින්වෙන පහත සඳහන් බිම් කැබලි:—

**කැබැල්ල අංකය. 362.**

ඉඩමේ නම: සියඹලාගහමුල පිල්ලැව; විස්තරය: අවුරුදු 20ක් වයසැති පොල් ගස් 2ක් හා අවුරුදු 3ක් වයසැති පොල්ගස් 2ක් සහිත පොල් ඉඩම; අයිතිවාසිකම් කියන්නා: එච්. ඇම්. අප්පුහාමි, එච්. ඇම්. හේරත්හාමි, දළුපොතගම, කටුපොත. එච්. ඇම්. කිරි මුදියන්සේ, කනෝගම. එච්. ඇම්. පුංචිබන්ඩා, පිස්කල් කන් තෝරුව, කටුපොත. එච්. ඇම්. පුංචිරාල, එච් ඇම්. පුංචිඅප්පුහාමි හේරත්, පහල පොතුවැව, කටුපොත. එච්. ඇම්. ගුණරත්නබන්ඩා, එච්. ඇම්. සිරිදරහාමි, එච්. ඇම්. සොබින්හාමි, පහලපොතුවැව, කටුපොත. එච්. ඇම්. ගුණරත්හාමි, කනෝගම. එච්. ඇම්. ගුණතිලක, කටුපොත. එච්. ඇම්. බන්ඩිහාමි, කොහොඹකඩවෙල, කෝන්වැව සහ එච්. ඇම්. සියාතුබන්ඩා, පහලපොතුවැව; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 17.3.

**කැබැල්ල අංකය : 363.**

ඉඩමේ නම : සියඹලාගහමුල පිල්ලෑව ; විස්තරය : අවුරුදු 20ක් වයසැති පොල් ගස් 3, අවුරුදු 3ක් වයසැති පොල් ගස් 17, ගලෙන් බැඳි පොල් අතු සෙවිලිකළ ස්ථිර පාඨශාලා ගොඩනැගිලි 1, ගලෙන් බැඳි කොන්ක්‍රීට් වහලක් ඇති ස්ථිර වැසිකිළි 1 සහ මැටි බිත්ති ඇති පොල් අතු සෙවිලිකල තාවකාලික ගොඩනැගිලි 1ක් සහිත පොල් ඉඩම ; අයිතිකම් කියන්නෝ : එච්. ඇම්. අප්පුහාමි, එච්. ඇම්. හේරත්හාමි, දළුපොතගම, කටුපොත. එච්. ඇම්. කිරිමුදියන්සේ, කනෝගම එච්. ඇම්. පුංචිබන්ඩා, පිස්කල් කන්තෝරුව, කටුපොත. එච්. ඇම්. පුංචිරාල, එච්. ඇම්. පුංචිඅප්පුහාමි හේරත්, පහල පොතුවැව, කටුපොත. එච් ඇම්. ගුණරත්නබන්ඩා, එච්. ඇම්. සිරිදර හාමි, එච්. ඇම්. සොබින්හාමි, පහලපොතුවැව, කටුපොත. එච්. ඇම්. ගුණරත්හාමි, කනෝගම. එච්. ඇම්. ගුණතිලක, කටුපොත. එච්. ඇම්. බන්ඩිහාමි. කොහොඹකඩවෙල, කෝන්වැව සහ එච්. ඇම්. සියාතු බන්ඩා, පහලපොතුවැව ; ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 35.8.

**කැබැල්ල අංකය 364.**

ඉඩමේ නම : විරගල්පොත්තේ වත්ත ; විස්තර : හේන ; අයිති කම් කියන්නා : බී. ධර්මකීර්ති සථවිර, පහලපොතුවැව, කටුපොත ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.2.

**කැබැල්ල අංකය 365.**

ඉඩමේ නම : අඹගලගාවාවත්ත වීරගල්පොත්තේ වත්ත, පින්හේන ; ඹිස්තර : වතුර පාර සහ අවුරුදු 30 වැඩි වයසැති පොල් ගස් 12, අවුරුදු 6ක් වයසැති පොල් ගස් 8, අවුරුදු 30 වැඩි වයසැති අඹගස් 1ක් හා අවුරුදු 15ක් වයසැති පේර ගස් 1ක් සහිත පොල් ඉඩම; අයිතිකම් කියන්නා: බී. ධර්මකීර්ති සථවිර, පහලපොතුවැව, කටුපොත; ප්‍රමාණය: අ. 1. රූ. 0. ප. 0. 8.

අත් කර ගැනීමට අදහස් කරන ඉහත කී ඉඩමට සම්බන්ධතාවයන් ඇති සියලුදෙනාම ඔවුන්ම හෝ ඔවුන් වෙනුවෙන් පෙනී සිටීමට ලිපි යකින් බලය ලත් නියෝජිතයින් 1959 මැයි මස 27 වෙනි දින 9ට හෙට්ටිපොල තානායම් පලේ දී මා ඉදිරියේ පෙනීසිටින මෙන් මෙයින් නියම කරමි. තවද ඉඩම පිළිබඳ සම්බන්ධතාවද එම ඉඩම පවරා ගැනීමේදී ඉල්ලන වන්දි මුදලේ විස්තරද, ඉල්ලන වන්දි මුදලේ ප්‍රමාණය හා එය ගණන් බැලීම සම්බන්ධ විස්තරද 1959 මැයි මස 20 වෙනි දින හෝ ඊට පෙර හෝ පිටපත් දෙකකින් යුත් දැන්වීමකින් මට ලියා දැන්විය යුතු යයිද නියම කරමි.

කේ. වී. ඇස්. කදිර්ගාමනාදන්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්ත තැන.

1959ක්වූ මාර්තු මස 23 දින,
කුරුණෑගල කච්චේරියේ දීය.

---

## 1954ජේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනයවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954ජේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥපනතින් සංශෝධනයවූ 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:—

ප්ලෑන් නම්වර: පී.පී.ඒ 904. ගම: තුල්හිරිය

**ඉඩම් කට්ටියේ නො. 2.**

ඉඩමේ නම : උනපඳුරමුලහේන ; විස්තර : අවුරුදු 25 වයසැති පොල් ගස් සහිත ඉඩම ; ඉඩමට හිමිකම් කියන අය : එච්. පී. ජයතුවා, තුල්හිරිය, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.1.

**ඉඩම් කට්ටියේ නො. 3.**

ඉඩමේ නම : කඳඇලවත්ත ; විස්තර : අවුරුදු 25 වයසැති පොල් ගස් 3ක් හා අවුරුදු 20 වයසැති පුවක්ගස් 2ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : එච්. පී. ජයතුවා, තුල්හිරිය, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 7.9.

**ඉඩම් කට්ටියේ නො 4.**

ඉඩමේ නම : කඳඇලවත්ත ; විස්තර : අවුරුදු 20ක් වයසැති පොල් ගස් 2යි, කෙසෙල් පඳුරු 2යි, දෙල්ගස් 1යි, කොස් ගස් 1යි, මිල්ලගස් 1යි, දෙහි ගස් 1ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ජේ. පී. මෝහනා, තුල්හිරිය, වරකාපොල ; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 4.1.

**ඉඩම් කට්ටියේ නො. 5.**

ඉඩමේ නම : කඳඇලවත්ත ; විස්තර : අවුරුදු 25 පමණ වයසැති පොල් ගස් 3ක්, අඹගස් 1ක්, පුවක්ගස් 5ක්, දොඩම්ගස් 1ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : පී. පී. බන්ඩියා, තුල්හිරිය, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, පා. 9.0.

**ඉඩම් කට්ටියේ නො. 6.**

ඉඩමේ නම : කඳඇලහේන ; විස්තර : අවුරුදු 25 වයසැති පොල් ගස් 4යි, අවුරුදු 5ක් වයසැති පුවක්ගස් 5ක්, සපුගස් 1ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ජේ. ඇම්. පුංචිබණ්ඩා, තුල්හිරිය, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 8.7.

**ඉඩම් කට්ටියේ නො. 7.**

ඉඩමේ නම : ගලිඳමුලවත්ත ; විස්තර : අවුරුදු 25 වයසැති පොල් ගස් 5ක් සහ මිල්ලගස් 2ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ඇන්. රත්නායක, මඩබාවිට, දන්ඹිවිට ; ප්‍රමාණය: අ. 0, රූ. 1, ප. 6.7.

**ඉඩම් කට්ටියේ නො. 8.**

ඉඩමේ නම : කහටගහමුලවත්ත ; විස්තර : අවුරුදු 25 පමණ වයසැති පොල් ගස් 5ක් සහ අවුරුදු 10 වයසැති මිල්ලගස් 2ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ඇල්. පී. ඒ. ඒබ්‍රහම් සිංඤෝ, තුල්හිරිය, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 16.7.

### පුහුවලගම.

**ඉඩම් කට්ටියේ නො. 9.**

ඉඩමේ නම: හිරිනෙවත්ත; විස්තර: අවුරුදු 20 වයසැති පොල් ගස් 10 සහ මාරගස් 1ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ආර්. ඒ. ඩිංගිරි අප්පුහාමි, හුනුවල, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 14.2.

**ඉඩම් කට්ටියේ නො. 10.**

ඉඩමේ නම : ඉල්ලුක ; විස්තර : අවුරුදු 20 වයසැති පොල් ගස් 5ක් සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : කේ. ඇම්. උක්කු බණ්ඩා, මන්ගෙදර, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 16.0.

**ඉඩම් කට්ටියේ නො. 11.**

ඉඩමේ නම : ඉල්ලුක ; විස්තර : අවුරුදු 20 පමණ වයසැති පොල් ගස් 2ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ඇස්. ඒ. පුංචි බණ්ඩා, හුනුවල, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 10.2.

**ඉඩම් කට්ටියේ නො. 12.**

ඉඩමේ නම : ඉල්ලුක ; විස්තර : අවුරුදු 5-15 දක්වා වයසැති පොල් ගස් 13ක්, අඹගස් 1ක්, කොස් ගස් 1ක් සහ කජුගස් 1ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ඇල්. ඇම්. බෙබිනෝනා, හුනුවල, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 21.0.

**ඉඩම් කට්ටියේ නො. 13.**

ඉඩමේ නම : කොලොන්ගහමුලහේන ; විස්තර : මුඩු ඉඩමකින් බාගයක් සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ඇල්. පී. ඒ. ඒබ්‍රහම් සිංඤෝ, තුල්හිරිය, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 01.2.

**ඉඩම් කට්ටියේ නො. 14.**

ඉඩමේ නම : කොලොන්ගහමුලහේන ; විස්තර : අවුරුදු 25 වයසැති පොල් ගස් 6ක්, පුවක්ගස් 2ක් සහ අඹගස් 1ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ආර්. ඒ. විලියම් සිංඤෝ, හුනුවල, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 13.1.

**ඉඩම් කට්ටියේ නො. 15.**

ඉඩමේ නම : ඉඹුල්ගහමුලහේන ; විස්තර : අවුරුදු 25 පමණවූ පොල්ගස් 13ක්, පුවක් ගස් 2ක් සහිත ඉඩම සහ ඇලෙන් කොටසක් ; ඉඩමට හිමිකම් කියන අය : ආර්. මුදියන්සේ, හුනුවල, වරකාපොල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 21.2.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959 මැයි මස 19 වෙනි දින උදේ 10 වේලාවට අඹේපුස්ස තානායමේදී මා සම්මුඛවිය යුතුයි.

තවද, 1959 මැයි මස 12 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇල්. බී. හුලංගමුව,
කෑගල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

1959ක්වූ මාර්තු මස 23 දින,
කෑගල්ල කච්චේරියේදීය.

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කච්චේරි දැන්වීමයි

### (මධ්‍යම පන්ති ලාංකිකයන්ට)

වවුනියාවේ දිසාපතිතුමා විසින් ඉඩම් සංවර්ධන පනත යටතේ ඉඩම් කච්චේරියක් වශී 1959ක්වූ අප්‍රේල් මස 30 වෙනි දින වවුනියා කච්චේරියේ දී පවත්වන බව මෙයින් නිවේදනය වේ. මෙදිනට දීමට යෝජිත ඉඩම්වල විස්තර පහත දක්වේ :—

2. ඉඩම් මධ්‍යම පන්ති ලාංකිකයන්ට පමණක් සීමාවන අතර ප්‍රමාණය අක්කර 10ක බිම් කට්ටි වශයෙනි.

3. මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රයේ පිළිවලට ඉල්ලුම් පත්‍ර 1959ක්වූ අප්‍රේල් මස 25 වෙනි දිනතෙක් බාර ගනු ලැබේ. සෑම ඉල්ලුම් පතක්ම වවුනියාවේ දිසාපති තුමාට එවිය යුතුයි.

4. සෑම ඉල්ලුම්කරුවෙක්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. එසේ නැතහොත් ඔහුගෙන් ලිපියක් ලත් නියෝජිතයෙක්වත් පැමිණිය යුතුයි. ඉල්ලුම්කරු හෝ නියෝජිතයාවත් ඉඩම් කච්චේරියට නොපැමිණියෙහි නම්, ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රය ගැන ඉන් එහාට ක්‍රියා කිරීමට අනවශ්‍ය ලෙස සලකනු ලැබේ. ඉඩම් දියුණු කර ලීමට හැකි බවට සාධක වශයෙන් ඉල්ලුම්කරුගේ මුදල් තත්ත්වය (උදාහරණයක් වශයෙන් අයබදු ගණන් බැලීමේ සහතිකය හා බැංකුවේ ඉතිරි මුදල් ගණන් බැලීම් කියවෙන නිවේදන) හා ආදායම් තත්ත්වයේ විස්තර, ඉඩම් කච්චේරියේදී ඉල්ලුම්කරු ඉදිරිපත් කළ යුතුයි.

5. වාර්ෂික බදු මුදල ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට හතරක්වේ. තෝරා පත් කර ගත් සෑම ඉල්ලුම්කරුවෙක් විසින්ම තෝරා පත්කර ගත් බව දැන්වූ වහාම 1959 වාර්ෂික බදු මුදල හා අතිරේක තැන්පත් මුදලක්ද වහාම තැන්පත් කළ යුතුයි. මුදල් ප්‍රමාණය ඉඩම් කච්චේරියේදී දැනුම් දෙනු ලැබේ.

6. දීමට යෝජිත ඉඩම්වල වගා කිරීමට යෝග්‍ය දෑ එම ඉඩම්වලට කෙලින් සඳහන් කර ඇත.

මේ ඉඩම් කච්චේරිය සම්බන්ධව සෑම ලිපියක්ම වවුනියාවේ දිසාපති තුමාට එවිය යුතුයි.

පී. පෙරේරා,
වවුනියාවේ දිසාපතිතුමා වෙනුවට.

කච්චේරිය, වව්නියාව.
23. 3. 1959.

යෝජිත ඉඩම්වල විස්තර :—

**ඉඩමේ පිහිටීම.**—දීමට යෝජනාකර ඇති මේ ඉඩම් ප්‍රමාණය යාපනේ-නුවර පාරේ සැතපුම් කනු 121ටත් 122 අතරෙහිය. උතුරට පන්ඩිකෙයිත්තකුලම්-මරෙයිඅඩිතෙකුල්ම් (යාපනේ-නුවර පාරේ සැතපුම් 122½ අසලින්) නැගෙනහිරට මරෙයිඅඩිතකුලම්-වෙඩමහිලන් කුලම පාර, දකුණට වෙඩමහිලන්කුලම (සැතපුම් 121 කණුව) පාර සහ බස්නාහිරට දුම්රිය මාර්ගය.

**යෝග්‍ය පලතුරු වගී.**—ස්ථිර ගොඩ ගොවිතැන්වලට පලතුරුවලින් යෝග්‍ය වගී: අඹ, පොල් සහ වෙනත් දෑ සහ තාවකාලික සෘතු වැවිලි වශයෙන් රතුළූනු, මිරිස් සහ ගොඩ ගොවිතැන් පලතුරු.

දීමට තිබෙන මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 800 ය.

**ඉඩම් සංවර්ධන පනත යටතේ ආණ්ඩුවේ ඉඩම් සඳහා ඉල්ලුම් පත්‍රයයි**

(1) සම්පූර්ණ නම හා ලිපිනය :————.
(2) ස්ථිර පදිංචිය :————.
(3) රක්ෂාව :————.
(4) ලාංකිකයෙක්ද යන වග :————.
(5) (i) විවාහකද අවිවාහකද යන වග :————.
(ii) තමන්ගෙන් රැකෙන ගණන හා ඔවුන්ගේ වයස්: ————.
(6) ආදායම් බදු දෙපාර්තමේන්තුවේ අන්තිම තක්සේරු නොතීසිය ප්‍රකාර වර්ෂයකට ලැබෙන ආදායම :————.
(7) දැනට තිබෙන මුදල් තත්ත්වය :————.
(8) පෞද්ගලික ඉඩම්වල විස්තර හා ඒවායේ තත්ත්වය :
ගොඩ ඉඩම්: අ.—, රූ.—, ප.—, ආදායම් පාලක දිස්ත්‍රික්කය හා පිහිටා ඇති ප්‍රදේශය :————.
මඩ ඉඩම්: අ.—, රූ.—, ප.—, ආදායම් පාලක දිස්ත්‍රික්කය හා පිහිටා ඇති ප්‍රදේශය :————.
(9) බද්දකට හෝ ඉඩම් සංවර්ධන පනත යටතේ ගත් ආණ්ඩුවේ ඉඩම්වල විස්තර හා ඒවායේ තත්ත්වය :
ගොඩ ඉඩම්: අ.—, රූ.—, ප.—, ආදායම් පාලක කාර්යාලය හා පිහිටා ඇති ප්‍රදේශය :————.
මඩ ඉඩම්: අ.—, රූ.—, ප.—, ආදායම් පාලක කාර්යාලය හා පිහිටා ඇති ප්‍රදේශය :————.
(පුරුෂයාට හා භාර්යාවට අයිති ඉඩම් වෙන වෙනම සඳහන් කළ යුතුයි.)



(10) ඉල්ලුම් කරන ඉඩම්වල විස්තර (ගමේ නම සඳහන් කරන්න):—
(11) වැවීමට යෝජනා කරණ ධාන්‍ය වර්ග හා පලතුරු වගී: ————.
(12) වර්ෂයකට ඉඩමට යොදවන්නට බලාපොරොත්තුවන මුදල : ————.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## මධ්‍යම පංති ඉඩම් කච්චේරියේ දැන්වීමයි

පහත පෙණෙන උපලේඛනයේ සඳහන් ආණ්ඩුවේ ඉඩම් දීමට ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. සියලුම ඉල්ලුම් පත්‍ර මෙහි පහත දී තිබෙන අයදුම් පතේ විස්තර ප්‍රකාරයට සම්පූර්ණ කොට මඩකලපුව දිස්ත්‍රික්කයේ දිසාපති තුමා වෙත, 1959 මැයි මස 4 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන්ට සැලැස් විය යුතුයි.

3. ඉඩම් ලබා ගැනීමට සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම පිණිස මඩකලපු දිසාපති කායඝාලයේදී 1959 මැයි මස 25 වැනි දින පෙරවරු නවයට ඉඩම් කච්චේරියක් පවත්වනු ලැබේ. සියලුම අයදුම්කරුවන් ඉඩම් කච්චේරියට පැමිණෙන්ට උවමනා බවත්, එසේ පැමිණෙන්ට නොහැකි නම් තමන් වෙනුවට බලය ලත් කෙනෙක් ලියවිල්ලකින් පෙනී සිටිය හැකි බවත් දන්වමි. ඉල්ලුම්කරු හෝ ඔහුගෙන් ලියවිල්ලකින් බලය ලත් යම් කෙනෙකු ඉඩම් කච්චේරියේ පෙනී සිටියේ නැත්නම් ඉල්ලුම්කරු ඉඩම ලබා ගැනීමට බලාපොරොත්තුවක් නැති ලෙස සලකනවා ඇත.

4. ඉඩම් දීමට තෝරා ගත් සියලුම අයදුම්කරුවන් තමන්ට දැන්වූ වහාම තමන්ට දෙන්ට යන ඉඩමට රුපියල් 30/- බැගින් බඳින්ට වුවමනා බව දන්වමි. ඉඩම් මැනීමට නුවුවමනා වියදම් ආණ්ඩුවට දැරීමට අයදුම්කරුගේ නොසැලකිලිකමින් සිදු වුවහොත් ඉහත බඳින මුදල ආපසු නොදෙන බව දන්වමි. එසේ බඳින ලද මුදල් යම් කෙනෙකුට දීමට හෝ නොදීමට ඉඩම් කොමසාරිස් තැන තීරණය කළොත් එම තීරණය අන්තිම තීරණයයි.

5. ගොවිකම් පාසලෙන් සමත්වූ ශිෂ්‍යයන්ගෙන් හෝ අවුරුද්දකට ආදායම් රුපියල් 12,000කට වැඩි නොවන අවිවාහක හෝ අවුරුද්දකට ආදායම් රුපියල් 24,000කට වැඩි නොවන විවාහක අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍ර සම්බන්ධව පමණක් සලකා බලනු ලැබේ.

අන්තිම වරට ආදායම් තක්සේරු කරන දෙපාර්තමේන්තුවෙන් ලැබුණු තක්සේරු පත තමාගේ ආදායම් ඔප්පු කිරීම පිණිස ඉඩම් කච්චේරියේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

ඉහත සඳහන් පන්ති පිළිවෙලට තෝරා ගැනීම පවත්වනවා ඇත. ඉල්ලුම්කරු තමන්ට වෙන් කරන ලද තැන්පත් මුදල් තිබෙන බව මට වැටහීමට කරුණු පෙන්නුවොත් සහ ඔවුන්ගේ ඉඩම දියුණු කිරීමට සමත්කමක් ඇති බව මට හැඟී ගියහොත් ඉහත සඳහන් පන්ති වෙනුවෙන් නොපිළිපැද එයින් වෙනස්ව තේරීම පවත්වනවා ඇත.

6. ඉහත කී අයදුම්කරුවන්ට, ඉඩම් සංවර්ධන පණතේ ප්‍රකාර ඉඩම් දෙනු ලැබේ. අවුරුද්දකට ඉඩම් වැඩි දියුණු නොමැති වටිනාකම හැටියට තක්සේරු කළ අයුරු සියයට 4 බැගින් ඉඩම් ලබා ගන්නා අය විසින් බද්ද ගෙවිය යුතුයි.

7. ඒකක ක්‍රමය අනුව අක්කර 10ක් බැගින් ඉඩම් බෙදා දෙනු ලැබේ.

8. සඳහන් ඉඩම්වල වැවීමට සුදුසු භෝග වී බවද, නමුත් ඉඩම් දීමට තෝරා ගන්නා අයවලුන් විසින් ඒ ඉඩම්වල සංවර්ධන වැඩ පිළිවෙලට අනුව භෝග වැවිය යුතුයි. ඒ ඉඩම්වලට වාරිමාර්ගයෙන් වතුර ලබා ගන්නට නොහැක.

9. බදු දීමේ කොන්දේසිය යනාදිය හෝ ඉල්ලුම් කිරීම ගැන තව දුරට විස්තර වුවමනා නම් මඩකලපුව දිස්ත්‍රික්කයේ දිසාපතිතුමාගෙන් ලබාගත හැක.

ඩබ්ලිව්. පතිරන,
මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපති තැන.

1959 මාර්තු මස 24 වැනි දින,
කච්චේරිය, මඩකලපුව.

## ඉඩම්වල ලේඛනය

ප්‍රාදේශීය ආදායම් නිලධාරිතුමාගේ කොට්ඨාශය : කෝරළ පත්තුව ; ගම : පුදුවෙලි ; දීමට තිබෙන ඉඩම් ප්‍රමාණය : අක්කර 1,000ක පමණ ඉඩම්ය ; වැවිලිවලට සුදුසු භෝග : වී.

**පුදුවෙලි යන ගමේ ආණ්ඩුවේ ඉඩම් ලබාගැනීමේ අයදුම් පත්‍රය**

1. අයදුම්කරුගේ නම සහ ලියුම් ලැබෙන පිළිවෙල :————.
2. සදාකාලික පදිංචි ස්ථානය (පදිංචි ස්ථානයෙන් මාරුවීමක් සිදුවූ විට ඉල්ලුම්කරු විසින් දිසාපතිතුමාට ඒ ගැන දැන්විය යුතුයි) :————.

3. රක්‍ෂාව :————.

4. ලාංකිකයෙක් ද යන වග :————.

5. විවාහකද ? තමාගෙන් යැපෙන්ට සිටින ගණන :————.

6. ආදායම් දෙපාර්තමේන්තුව පසුගිය වාරයට තක්සේරු කළ අයුරු අවුරුද්දකට ආදායම් කීයද ? :————.

7. තැන්පත් කර තිබෙන මුදල කොපමණද ? :————.

8. පුද්ගලිකව අයත් ඉඩම්වල විස්තර හා එය කුමන අන්දමට ප්‍රයෝජන ගන්නෙහිද යන වග :————.

ගොඩ ඉඩම් : අ.——රූ.——ප.——.

මඩ ඉඩම් : අ.——රූ.——ප.——.

9. ආණ්ඩුවේ ඉඩම් බදු හෝ ඉඩම් සංවර්ධන ක්‍රමය යටතේ අයත් ඉඩම්වල විස්තරයක් ; එය කුමන අන්දමට ප්‍රයෝජන ගන්නෙහිද යන වග :————.

ගොඩ ඉඩම් : අ.——රූ.——ප.——.

මඩ ඉඩම් : අ.——රූ.——ප.——.

10. අවුරුදු පතා මේ වෙනුවෙන් තැන්පත් කිරීමට කැමැති මුදල් කොපමණද ? :————.

————,

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## අනුරාධපුර නව නගරයේ බූමිතෙල් ගබඩාවක් සඳහා බිම් කොටසක් බදු දීම

අනුරාධපුර නව නගරයේ 1 වැනි කොටසේ පිහිටි අංක 1 සිට 14 දක්වාවූ පී. ඇස්. පී. සැලැස්මෙන් හා අංක 257 259 හා 523 දරණ උ. මැ. ප. අවසාන ග්‍රාමීය සැලැස්මවල් වලින් අතිරේක වශයෙන් ඒකාබද්ධවූ අංක 107 දරණ ඉඩම් කැබැල්ලෙන් පර්චස් 20 ක් පමණ වූ ඉඩම් ප්‍රමාණය, එනම් රජයේ ඉඩම් කොටස බූමිතෙල් ගබඩාවක් සෑදීම සඳහා බදු දීම 59.4.30 වැනි දින පස්වරු 2 ට අනුරාධපුර කච්චේරියේදී අනුරාධපුර පාලක දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ දිසාපති (මීට පසු ආණ්ඩුවේ දිසාපති යනුවෙන් හැඳින්වනු ලබන) විසින් ප්‍රසිඬ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. වෙන්දේසිය ලන්සයක් අනුව පටන් ගනු ලැබේ. ලන්සය රුපියල් 12,000 ට අඩුව කරනු ලබන කිසිම ඉල්ලීමක් භාරගනු නො ලැබේ.

3. ඕනෑම ඉල්ලීමක් භාර ගැනීමට පෙර ඉල්ලුම්කරුගේ සම්රතාවයත් බද්දේ කොන්දේසි නිසිලෙස ඉටු කළ හැකිද යන්නත් ගැන ආණ්ඩුවේ දිසාපති තුමා විසින් සොයා බලනු ලැබේ. තෙල් කොම්පැනියක බලය ලත් ඒජන්ත කෙනෙකුගේ හෝ බලය ලත් නියෝජිතයකු හැර අන් කිසිවෙකුගේ ඉල්ලීම් භාරගනු නො ලැබේ. ආණ්ඩුවේ දිසාපති තුමාගේ සතුටට හේතුවන පරිදි කරුණු නො මැති වුවහොත් එවැනි ඉල්ලීමක් නො කළාක්මෙන් සළකා වෙන්දේසිය පවත්වාගෙන යනවා ඇත.

4. සෑම අයදුම්කරුවකුම නියමිත වේලාවට එකී ස්ථානයට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් බලය පවරණ ලද නියෝජිතයකු ඉදිරිපත් කරන්නේ නම් ඊට අවශ්‍ය බලපත් පරීක්‍ෂා කර බැලීම පිණිස වෙන්දේසිය පටන් ගැනීමට පෙර ඉදිරිපත් විය යුතුයි.

5. තෝරාගනු ලැබූ ඉල්ලුම්කරු භාරගත් වහාම තමා විසින් ඉල්ලුම් කළ මුදලත් අත්තිකාරම් වශයෙන් අවුරුද්දක බදු මුදලත් ගෙවිය යුතුයි.

(1) තෝරාගනු ලැබූ ඉල්ලුම් කරු දින 14 ක් ඇතුළතදී ඉඩමේ බද්ද භාරගත යුතුයි. එය අතපසු වුවහොත් දිසාපති තුමා විසින් එම විකිණීම අවලංගු කර ගෙවා තිබෙන මුදල රජය සන්තක කරනු ලැබේ.

6. බදු බලපත්‍රයේ ඇතුළත් කොන්දේසිවලට අනුකූලව පහත සඳහන් කොන්දේසිද මීට අමතර වශයෙන් ඇතුළත් වෙනවා ඇත :—

(අ) කාලය අවුරුදු 20 ;

(ආ) බදු මුදල අවුරුද්දකට රුපියල් 480 යි ;

(ඇ) බදුකරු මෙම ඉඩම බූමිතෙල් ගබඩාවකට හැර අන් කිසි කටයුත්තකට නො යෙදිය යුතුයි. එසේ යෙදිය හැක්කේ ආණ්ඩුවේ දිසාපති තුමාගේ කැමැත්ත ප්‍රකාශ කරන ලිපියක් ලදහොත් පමණකි ;

(ඉ) බදුකරු බද්ද ලබාගත් දින සිට මාස හයක් ඇතුළතදී ආණ්ඩුවේ ඒජන්ත තුමාගේ සතුටට හේතුවන පරිදි බූමිතෙල් ගබඩාවකට නියමිත ගොඩනැගිලි යනාදිය ඉදි කළ යුතුයි. ආණ්ඩුවේ දිසාපති තුමාගේ අනුමතය සහිත ලිපියක් නොමැතිව වැඩිපුර ගොඩනැගිලි යනාදිය ඉදි නො කළ යුතුයි ;

(ඊ) දිසාපති තුමාගේ සතුටට ලක්වන පරිදි බදුකරු ඉඩ කඩ ඇති බෝක්කු සහිත පිවිසෙන මාර්ග සෑදිය යුතුයි ;

(උ) ඉඩම් කොමසාරිස් තුමාගේ අනුමතය සහිත ලියවිල්ලක් නැති බදු හිමියා විසින් මේ ඉඩම වෙන අයකුට බලය පැවරීම, තෑගි කිරීම, උකස් කිරීම හෝ වෙන ක්‍රමයකින් විකිණීම නො කළ යුතුයි ;

(ඌ) බදුකරු විසින් ඉඩම සහ ගොඩනැගිලි වෙනුවෙන් ගෙවිය යුතු සියළුම බදු මුදල සහ තක්සේරු ගාස්තු ගෙවිය යුතුයි ;

(එ) බදු කාලය අවසානයේදී හෝ ඊට පෙර බද්ද අවලංගු කිරීමක්දී ඒජන්ත තුමා විසින් නියම කරන කාලය ඇතුළතදී ඉඩම සහ ගොඩනැගිලි ආදිය ට අනතුරු නොවන පරිදි දිසාපති තුමාට හෝ ඔහුගේ බලය ලත් නිළධාරී තැනට භාරදිය යුතුයි.

(ඒ) ඉඩමේ ඉතිරිවූ ගොඩනැගිලි වලට හෝ වෙන කිසියම් දෙයකට ආණ්ඩුවෙන් වන්දි මුදලක් ඉල්ලීමට බදුකරු සුදුස්සෙක් නොවේ.

7. මේ පිළිබඳ වැඩි විස්තර සඳහා අනුරාධපුර ආණ්ඩුවේ දිසාපති තුමාගෙන් විමසන්න.

සී. සී. ඇල්. අමරසිංහ,
අනුරාධපුර දිසාපති.

1959 මාර්තු මස 24 වැනි දින,
අනුරාධපුර දිසාපති කාර්‍යාලයේ දීය.

# විශෙෂ නිවේදනයයි

1959 අප්‍රියෙල් 10 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රියෙල් මාසයේ දෙවැනි සුමානයේ ගැසට් පත්‍රය, 1959 අප්‍රියෙල් 9 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 අප්‍රියෙල් 6 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 23 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

# විශෙෂ නිවේදනයයි

1959 අප්‍රියෙල් 14 වැනි අඟහරුවාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රියෙල් 17 වැනි දින නිකුත්කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 අප්‍රියෙල් 13 වැනි සඳුද පස්වරු 4 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 මාර්තු 26 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරණු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාද දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ **ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිටය.**

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාද දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30 ට සහ සෙනසුරාද දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චැක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත **කඩදසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ, නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් **හෝ පළ කරණු නොලැබේ.**

9. **උසාවියේ අණ** පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, **සුප්‍රිම් උසාවියේ** පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා **1955** ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට... ... .... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුවම අය කරණු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරණු ලැබේ.** ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින තුනකට ප්‍රථම **පස්වරු 4ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් අඟහරුවාද පස්වරු 4ට ප්‍රථමයෙන්).**

13. **ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.**

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... ... | එක් කාණ්ඩයක් සඳහා... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිටපතකට... ... | ... ... | 0 | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... ... | ... ... | 0 | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග | 0 | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් **වේ. මෙය කොළඹ, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ** අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී